ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 දෙසැම්බර් 09 සඳුදා
06 වෙළුම - 06 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## කඳාන දිසා ධර්මදූත ළමා සමාජය

# මරිය වසර සමරයි

Photo By: Thilina Alahakoon CCP

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# අම්මා ගැන දරුවන් අතිශයින් ප්‍රීති වී ඇත.

## ආදරණීය දුවේ පුතේ...

මරිය වසර උදවත් සමගම දැන් දැන් අපේ දූ පුතුන් දේව මාතාවන් වහන්සේ ගැන මහත් උද්යෝගයකින් කථා කරනවා. මෙනෙහි කරනවා. ලියනවා. හරිම අගෙයි මේ වසර තුළදී ඔබ සම්පූර්ණයෙන්ම මෙයට නතු වන්නට ඕනා. මූලධර්මවාදී අවස්ථාවාදිනට ඔබේ විශ්වාසයෙන් උත්තර දෙන්න ඕනා. කතෝලික දහමින් ඔකද වෙන්න ඕනා. අද ආරාධිත ලිපිය ලියා අවිශ්ක මාරියෝ සෙනෙවිරත්න පුතා ඉතාම ලස්සනට ''අම්මා පුදන්නයි දරු අප එන්නේ'' කියලා ලිපියක් ළමා ප්‍රදීපයට යොමු කරනවා. ඔබත් ආදර දුවේ පුතේ, දිරිමත් වීම අවශ්‍යයි, අපේ දේව අම්මා ගැන නිරතුරුව ලියන්නට, කියන්නට හා අන් අයට ඒ දේ බෙදා දෙන්නට. ඒ ආරාධනාව සමගින් අපි ගියවරත් මෙනෙහි කළ යැදුම නැවතත් මතක් කරනවා.

''මෑණියෙනී, අහෝ ස්වර්ගීය මාතාවෙනි, ඔබ තුමියගේ දයාබර පුතණුවන් සමීපයට පැමිණීමට අපට උදව් කරමින් සහ ඔබ තුමියගේ මාතෘක මැදිහත්කම තුළින් ආත්මික සහ ශාරීරික ප්‍රීතිය අත් දකින්නටත්, ඔබ තුමියගේ ප්‍රේමණීය ආරක්ෂාව සහ රැකවරණයද ජීවිතයේ පරිපූර්ණ ශුද්ධවන්තභාවයද අත් දකින්නට අපට වරම් දුන මැනව''. ආදර දුවේ පුතේ, මේ කුඩා යාච්ඤා ඉල්ලීම තුළ කතෝලික අපගේ විශ්වාසයේ පැවැත්ම සනිටුහන් වෙනවා. අපට ආරක්ෂාව අවශ්‍යයි. අපට රැකවරණය අවශ්‍යයි. ඒ පමණක් නොව අපට ජීවිතයේ පරිපූර්ණ ශුද්ධවන්ත භාවයද අත්‍යවශ්‍යයි. අපේ ගෙදර අම්මා අපට සලසා දෙන මේ සුරක්ෂිත භාවය අපි අත්දකින්නේ කෙසේද? ඒ අයුරින්ම මේ යැදුමේ සඳහන් වන පරිදිම පොදු පවුල රක්ෂා කරන අපේ පොදු මාතාවන් අපට ඒ සියල්ල ලබා දෙන්නට අප වෙනුවෙන් මැදිහත් වන බව සම්පූර්ණයෙන්ම පසක් කර ගන්නට, මේ වසර තුළ ඒ වෙනුවෙන්ම ඒකාත්මික වන්නට කරන ආරාධනාව සුලු කොට තකන්න බැහැ නේද?

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

## ආරාධිත ලිපිය - 05

# අම්මා පුදන්නයි දරු අප එන්නේ !

විශ්වාසයේ වසර තුළ අප සියලු දෙනා දේව තාත්තාට ප්‍රේම කිරීමටත් , අදහා ගැනීමටත් වඩ වඩාත් යොමු වුණා. විශ්වාසයේ වසර අවසන් වුවද අප තුළ තිබෙන දේව විශ්වාසය අප සදහටම තබා ගත යුතුයි. විශ්වාසයේ වසර අවසන් වුනත් අපේ විශ්වාසය මනා ලෙස නොකඩවා ඉදිරියට ගෙන යාමට මරිය වසර අප හට උදා වීම සැබවින්ම භාග්‍යයකි. කොළඹ අගරදගුරු පදවිය විසින් ක්‍රියාත්මක කරන මරිය වසර මේ වසරේ නොවැම්බර් මස 24 සිට 2014 වසරේ ආගමන සමයේ ප්‍රථම ඉරුදින වන නොවැම්බර් මස 30 දා දක්වා සිද වේ. කන්‍යා මරියාවට ළං වීම තුළින් දෙවිපියාණන් වහන්සේගේ දයා ප්‍රේමය අත්දැකීම මරිය වසරේ මූලික පදනම වේ. ගැළවීමේ ඉතිහාසය තුළ කැපී පෙනෙන චරිතයක් වන මරිය තුමිය ක්‍රිස්තුස් වහන්සේගේ මෙන්ම අපගේද දයාබර මෑණියන්ද වේ. ක්‍රිස්තුස් වහන්සේ කුරුස ගසේදී තම ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය අප හට තිළිණ කළා සේ තම මවගේ කරුණාබර ප්‍රේමයත් කන්‍යා මරියාවන් අපගේ මව ලෙසත් තිළිණ කිරීම වැදගත් කරුණකි. භාග්‍යවන්ත ii වන ජුවාම් පාවුළු පාප්වහන්සේ ඉහත සඳහන් කරුණ නිසා මරිය තුමියව '''සත්ප්‍රසාදයේ කාන්තාව '' ලෙසත් vi වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා ''සභා මාතාව'' ලෙසත් එතුමියව හඳුන්වා දීම සුවිශේෂී කරුණකි.

කන්‍යා මරියාවට මංගලම් කී අවස්ථාවේ දී දෙවියන් වහන්සේ ඇයට භාර කෙරූ ක්‍රිස්තුවරයාගේ මව වීමේ වගකීම, ඉතා බැහැපත්ව හා නිහතමානීව පිළිගැනීම අපට මහත් ආදර්ශයකි. ගැලවීමේ කාර්ය ඉදිරියට ගෙන යාම එතුමියට අපහසු වුවද දේව කැමැත්ත ඉටු කරමින් ගාබ්‍රියෙල් දූතයාට එතුමිය පැවසූවේ ''ඔබ කී ලෙස මට ඉටු වේවා.'' යන්නයි. ඇය ජේසු බිළිඳුව හදවඩා ගත්තා සේ අපවද එතුමිය සදහටම හදා වඩා ගනියි. මරිය තුමී කානා නුවර විවාහ උත්සවයේදී මුළු තැන් ගෙයහි තිබුණු ගැටලුව සොයා බලා විසඳුවා මෙන්ම අපගේ දුක් ගැටලු සෑම අවස්ථාවකදීම සොයා බලා විසඳන බව අප අමතක නොකරමු.

ජේසුස් වහන්සේ නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය ඔවුහු දෙවියන් වහන්සේ දකිනු ලබන්නෝය යැයි පැවසූ සේක. නිර්මල යනු බැහැපත් නිහතමානි , භක්තිවන්ත, දිළිඳු සරල දිවියක් ගත කරන පුද්ගලයන්ය. ඉහත කී සෑම ගුණාංගයක්ම අප කන්‍යා මරියාව තුළ දක්නට ලැබෙනවා. ඒ නිසයි ඇය දේව තාත්තාගෙන් පවා ''විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගලම් වේ'' යැයි ගෞරවය ලැබුණේ. එසේ නම් මිනිස් අපේ ආධ්‍යාත්මික මෑණියන්ට අපි ගෞරව කළ යුතුයි නේද?. එතුමිය ස්වර්ග රාජ්‍යයට තම ශරීරය හා පිවිසුණේ තමා තුළ තිබූ දැඩි නිර්මල භාවය නිසාය. ඇය පව්කාරයන්ගේද මාතාව වීම විශේෂ කරුණකි. ස්වර්ගරාජ්‍ය සිට එතුමිය පව්කරුවන්ගේ සිත්හැරීම උදෙසා නිරන්තරයෙන් යදිනවා. එතුමිය මෙලොවට ජපමාලය ලබා දුන්නේ පාපය නිසා දේව දයාව පතළ කිරීමටය. ඒ නිසයි එතුමිය ලූර්දු , පාතිමාව වැනි ස්ථානයන් හී කුඩා දරුවන්ට දර්ශනය වී ජපමාලය පව්කරුවන්ගේ මනස්ථාපනය උදෙසා උච්චාරණය කරන ලෙස අයැදුවේ. මරිය තුමිය අපට දක්වන මාතෘක ප්‍රේමයට අප ප්‍රතිප්‍රේමය දැක්වීම අපගේ පරම යුතුකමකි. අප දිවියේ දුකෙහිද සැපෙහිද එතුමියගේ ආදර්ශය අනුගමනය කරමින් අපට තිළිණ කළ මේ දේව අම්මාට අපි මරිය වසර තුළ ආදරය දක්වමු.

**අවිශ්ක මාරියෝ සෙනවිරත්න**

ශා. ජෝශප් විදුහල - කොළඹ 10




## මනුෂ්‍යයාගේ අන්තිම

❖ ප්‍රː නිරයට යන්නෝ කවරහු ද?
උː මරණීය පව් ඇතුව මැරෙන්නෝ නිරයට යන්නෝ ය.

❖ ප්‍රː නිරයෙහි විඳිය යුතු වේදනා මොනවාද?
උː දෙවියන් වහන්සේගෙන් සදාකාලයටම වෙන්වී ගින්නෙහි දුක් විඳීම ය.

❖ ප්‍රː ස්වල්ප පව් ඇතුව මැරෙන අය ද පව් ණය සම්පූර්ණයෙන් නොගෙවා මැරෙන අය ද යන්නේ කොතැනට ද?
උː ශුධිකාග්නිස්ථානයටය.

❖ ප්‍රː ශුද්ධිකාග්නිස්ථානයෙහි විඳිය යුතු වේදනා මොනවාද ?
උː දෙවියන් වහන්සේ නොදැක ස්වර්ග රාජ්‍යයෙහි උන්වහන්සේ දැකීමට වුවමනා පිරිසුදුකම ලැබෙන තුරු පව් ණය ගෙවමින් ගින්නෙහි දුක් විඳීම ය.

❖ ප්‍රː මැරුණ වහාම ඇති වන විනිශ්චය හැර තවත් විනිශ්චයක් ඇද් ද?
උː පොදු විනිශ්චයක් තිබේ.

❖ ප්‍රː පොදු විනිශ්චය පැමිණෙන්නේ කවදා ද?
උː ලෝක අන්තිම දිනයෙහි ය

❖ ප්‍රː ලෝකය අන්තිම වන්නේ කෙසේද?
උː මුළු ලෝකය ගින්නෙන් දා සැම මනුෂ්‍යයන් නැසී යාමෙන් ය

❖ ප්‍රː ඉන්පසු කුමක් වන්නේ ද?
උː ජේසු ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ සර්ව බලයෙන් සියලු මනුෂ්‍යයන් ආත්ම ශරීර ඇතිව නැගිටුවා බොහෝ මහිම ප්‍රතාප සම්පන්නව විනිශ්චය කරන සේක.

❖ ප්‍රː උන්වහන්සේ විනිශ්චය කරන්නේ කෙසේ ද?
උː එක එකා කළ පව් පින් සියල්ල සකල ජනයන් ඉදිරියෙහි ප්‍රකාශ කරන තීන්දුව දෙන සේක.

## දේව පනත් සහ ශුද්ධවූ සභාවේ ආඥා

❖ ප්‍රː ඔබ දෙවි පියාණන්ගේ සැබෑ දරුවකු බව පෙන්වන්නේ කෙසේ ද?
උː උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමෙන්ය.

❖ ප්‍රː උන්වහන්සේගේ කැමැත්ත දැනගන්නේ කෙසේ ද?
උː දේව පනත් දසයෙන් හා ශුද්ධවූ සභාවේ ආඥාවලින් ය.

❖ ප්‍රː දෙවියන් වහන්සේගේ පනත් කියන්න
උː
1. සැබෑ වූ එකම දෙවියන්ට වන්දනා කරව.
2. දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවට ද නිරර්ථයට ද නො දිවුරව.
3. ඉරු දින ද ණය මංගල්‍යය දිනද, (ශුද්ධවූ සභාවේ නියමය හැටියට) ශුද්ධ ලෙස ගත කරව
4. මවුපියන්ට සංග්‍රහ කරව.
5. ජීවිතය විනාශ නොකරව.
6. කාම මිත්‍යාචාරය නො කරව.
7. සොරකම් නො කරව.
8. බොරු සාක්ෂි නොකියව.
9. පරදාර ආලය නොකරව.
10. අන්වස්තු ආශා නො කරව.

මේ පනත් දසය පනත් දෙකක අඩංගු වන්නේ ය. ඒ කිම යත්, පළමු වනු ව, සියලු දේට වැඩියෙන් දෙවියන් කෙරෙහි ප්‍රේම වීමද, දෙවනුව, තම තමා හට ඇති දයාව සේ පරහටත් දයා කිරීමද වන්නේ ය.

❖ ප්‍රː ශුද්ධවූ සභාවේ ආඥා කියන්න.

උː
1. ඉරුදිනවල ද, ණය මංගල්‍ය දිනවල ද, දිව්‍ය පූජාවට සහභාගිවීම.
2. අවුරුද්දකට වරක්වත් පාපොච් චාරණය කිරීම.
3. අඩු තරමින් පාස්කු කාලයෙහිවත් දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම.
4. නියම වූ දින වල ගොඩමස් වැළකීම සහ එක්වරු සිල් රැකීම.
5. තහනම් වූ කාලයෙහි දී නෑකම් ආදි බාධා ඇතුව ද විවාහ නොකිරීම.
6. ශුද්ධ වූ සභාවේ දියුණුව හා ඥාන ගෝපාලයන්ගේ නඩත්තුව සඳහා ආධාර දීම.

# දහම් පාසලේ වටිනාකම



**ආදර දුවේ පුතේ,**

විවිධ අභියෝගයන් අතරින් ජය පරාජයන් හමුවේ ගෙවෙන අපගේ කිතුනු ජීවිත තුළ දහම් පාසල අපට යහපත් ජීවිතයක් ගෙවන්නට කියා දෙන ජීවිත පෙර පාසලයි.

එය යහපත් ලෙසින් ජීවත් වී මව්පියන්ට සලකන්නට, සහයෝගයෙන් කටයුතු කරන්නට කියාදෙන නාසරෙත්හි ශුද්ධවූ පවුල දකින්නට ලැබෙන කැඩපතයි. එපමණක් නොව, ජේසු ගැන දැනගන්නට දහම් දැනුමෙන් සන්නද්ධ වන්නට, මඟ පෙන්වන විශ්ව විද්‍යාලයයි. එමෙන්ම ශුද්ධවූ බයිබලය ගැන ඉගෙනගෙන දේව වචනය ගැන ගැඹුරින් අධ්‍යයනය කරමින් බයිබල් සාන්තුවරුන් හා එහි චරිත දකින්නට හැකි වන දහම් මාධ්‍යයයි. ඉතිං මේ දහම් පාසල නැමැති දහම් සයුරේ ගිලී එහි පතුලේ ඇති දහම් දැනුම නැමැති මුතු ඇට සොයායන්නට ඔබත් එන්න නිමක් නොමැති මේ සයුරේ කිමිදෙන්නට.

**දිලිනි හිමාලා**
**(ආචාර්ය මඩුල්ල)**
**ශාන්ත ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන**

# නොදැන ගියොත් අතරමග




සමහර පුංචි සිදුවීම් ඇතුලෙ හිතන්න මහ ගොඩක් දේවල් තියෙනවා. එක දවසක් අපේ දහම් පාසලේ උදේ පූජාව පටන් ගන්න ඔන්න මෙන්න කියලා තියෙද්දි පොඩි එකෙක් මූණ බෙරි කරගෙන අඬන්න ඔන්න මෙන්න. ඇයි කියල අහපුවහම බඩ රිදෙනවලු. පොඩි එවුන්ගේ බඩ රිදිල්ල ගැන සහතික දෙන්න බැරි උනාට කට්ටියගෙම තීරණය වුනේ පොඩි එකාව ගෙදර යවමු කියලා. තනියම යන වයසකත් නෙමේ නිසා 9 ශ්‍රේණියේ දහම් ගුරුතුමා ඒ වගකීම බාර ගත්තා. දහම් පාසල් ඉවර උනා. අපි දහම් ගුරුවරු ටික ආගිය තොරතුරු කථා කරමින් ඉන්න අතරෙ 9 ශ්‍රේණියේ දහම් ගුරුතුමා කිව්වා අපූරු කථාවක් ''මම ගියානේ පොඩි එකාව ඇරලන්න. ගේ දැනගෙන නෙවේනෙ ගියේ'' ''ඉතින්'' අපිට හරි කුතුහලය..... ''මම ඇහැව්වා පුතාගේ ගේ කොහේද කියලා....පොඩ්ඩා කියනවා. සුනිල් මාමලගේ ගෙට එහා පැත්තේ කියලා එහෙම කියලා දහම් ගුරුතුමා හිනාවෙනවා. අපි මොකට හිනාවෙන්නද? කුතුහලය එහෙමමයි. ගුරුතුමා ආපහු කථාව පටන් ගත්තා. ''සුනිල් මාමලගේ ගේ කොහෙද පුතේ? අපේ ගෙට මෙහා පැත්තේ කොල්ලා පැනලා උත්තර දුන්නලු. අපේ හිනාව පල්ලිය වත්ත පුරාම විසිරුණා.



**නිලූෂා ඈන් හිමාලි**
**ආචාර්ය මඬුල්ල**
**ශු. පවුලේ දහම් පාසල - රාජකදළුව**

# මිල්ලව දෙව්සත්හලේ සිසුන්ට ලේඛක වැඩමුළුවක්

කුරුණෑගල පදවියේ මිල්ලව හා. ජුසේ වාස් කනිටු දෙව්සත්හලේ ඉගෙනුම ලබන සිසුන් සඳහා ලේඛක වැඩමුළුවක් පසුගියද දෙව්සත්හලේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. ජනසන්නිවේදනය පුවත්පත්කලාව, නිර්මාණකරණය පිළිබඳව මෙහිදී සිසුහු දැනුම්වත් කළහ.

දෙව්සත්හලේ අදියුරු ගරු නිහාල් ඕබ්‍රිස් , පදවි දේව කැඳවීම් අධ්‍යක්‍ෂ ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමන්ලා ගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කෙරිනි.



**සේයා - ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමා**
**සටහන**
**ෂෙරෝන් ශානක / මලිත් ශාලික**
**හා. ජුසේ වාස් කනිටු දෙව්සත්හල - මිල්ලව**

# බණ්ඩිරිප්පුව ශු. ජපමාල මාතා දහම් පාසලේ දක්ෂ ලේඛකයෝ

## උදෑසන අසිරිය

උදෑසන උදා වනවාත් සමගම හිරු කුමරා කඳු බෑවුම් අතරින් එබී බලයි. අළුයම තුරන් වී ආලෝකය පැමිණෙනවාත් සමගම සතුන් කෑ ගසන්නට පටන් ගනී. පක්ෂීන්ගේ කිචි බිචි මිහිරි නාදය මුළු පරිසරයේම පැතිරෙයි. හිරු රශ්මිය නිසා ගස්වල රැඳී තිබෙන පිනිබිඳු මිදෙන්නට පටන් ගනියි. උදෑසනම කුකුළා හඬලයි. එම හඬ නිසා මුළු පරිසරයම අවදි වෙයි. මල් පීපී මල් වල සුවඳ දසත පැතිරෙයි. උදෑසන අවදිවූ ළමුන් පාසල් යාමට සූදානම් වෙයි. පාසල වෙත පියමන් කරන ළමුන් සුදු කොක්කු රෑනක් මෙනි. උදෑසන හමන මඳ සුළඟ ශරීරයට සිසිලසක් ගෙන දෙයි උදෑසන හරිම ප්‍රබෝධ ජනකයි.

**කාවින්දි කෞශල්‍යා**
**8 ශ්‍රේණිය - ශු. ජපමාල මාතා දහම් පාසල - බණ්ඩිරිප්පුව**



## ආදර අම්මා

ජීවිතයට පුන් සඳ වූ මගේ අම්මා
ආදරයේ උල්පත ඔබමයි අම්මා
ලේ කිරි කර දුක් විඳ මා වැඩු අම්මා
සැමදා රකිනු මැනවි දෙවිතුමනි මගේ අම්මා

**විශාකා මාරියන් ප්‍රනාන්දු**
**10 ශ්‍රේණිය**
**ශු. ජපමාල මාතා දහම් පාසල - බණ්ඩිරිප්පුව**

## රෝස මල



කටු අත්තක නුඹ පිපුණාට
රූව කදිමයි පිපුණු කලට
ඔබේ සුවඳ පැමිණෙන විට
සමනළයින් එයි වටේට

**මනෙත් දුල්ෂාන්**
**7 ශ්‍රේණිය - ශු. ජපමාල මාතා**
**දහම් පාසල - බණ්ඩිරිප්පුව**

## නොවේ අමතක ඔබේ මතකය

පසළොස්වක සඳ අහසේ පායා
නමුදු අමාවක සේ දිස්විය.....
වසන්ත සමය උදාවිය
නමුදු පාළු සෘතුවක මෙන්
දැනෙන්නට විය.......
ලොවෙහි සිනා සුන මුව , අද
කොනට වී ඉකි බිඳිනු ඇත.......
අහිමි පිය සෙනෙහස මා තුළ
සක්මන් කරනු ඇත......



**තාරුකා කාවින්දි**
**11 ශ්‍රේණිය - ශු. ජපමාල මාතා දහම් පාසල - බණ්ඩිරිප්පුව**

**වැඩමුළුවක ප්‍රතිඵලයක්**

## ඉඩෝරය



සැඩ හිරු
මඬල දවාලයි
මිහිකත
පොළෝ තලය
ඉරිතළා ගොස්
පෙනෙන තෙක්
මානයේ ජල
බිඳක් වත්
නොමැත
හිස් අහස් කුස
දෙස අපි නෙත් යොමා බලා සිටිමු
අහස් කුස ගුගුරුවා මුළු පොළොව සිසාරා....
වැසි බිමට වැටීයන් ......
සිතේ ගිනි නිවීයන්

**ඒෂලා චතුරංගි**
**9 ශ්‍රේණිය - ශු. ජපමාල මාතා දහම් පාසල - බණ්ඩිරිප්පුව**

## පුංචි රුවන් තාරකා

නිල් අහසේ රැයාමේ
සිනහා නගන තාරකා
අඳුර මැදින් එළිය ගෙනෙන
පුංචි රුවන් තාරකා
අහසේ රන් තරු කැටසේ
බැබළෙන රන් තාරකා
අල්ලන්නට ආසයි මට
පුංචි රුවන් තාරකා

**විශ්මි වත්සලා**
**06 ශ්‍රේණිය**
**ශු. ජපමාල මාතා දහම් පාසල**
**බණ්ඩිරිප්පුව**



**දේව අම්මා**
**සඳුනි නතාෂා ප්‍රනාන්දු**
**11 ශ්‍රේණිය**
**ශු. ජපමාල මාතා දහම් පාසල**
**බණ්ඩිරිප්පුව**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයට ඔබ සුදානම්ද ?

**● වසර 11 ක අධ්‍යාපනයෙන් පසු ඉදිරි දිනයක ඔබ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට ඔබ සුදානම් දැයි ඇසීම සාධාරණ නොවේ යැයි මම සිතමි.**

**● කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට පෙර මේ ගැන හිතන්න.**

**● මේ විෂයය සැහැල්ලු කරන්න එපා**
**● අවතක්සේරුවෙන් පිළිතුරු ලියන්න එපා**
**● කතෝලික ධර්මය විෂයයට සමාජ විද්‍යාඥයකුගේ පිළිතුරු ලියන්න උත්සහ නොකරන්න.**
**උදා :- ඔබ පන්ති කාමරය තුළ ජේසු අනුගාමිකයකු ලෙස කටයුතු කරන්නේ කෙසේදැයි යන ප්‍රශ්නයට ''වට්ටි අම්මා'' කෙනකුගේ උත්තර නොලියන්න.**

**● එවැනි ප්‍රශ්නයකට තාත්වික , බයිබලීය පිළිතුරු පමණක් ගලපන්නට උත්සාහ කරන්න.**
**● ඉහත ප්‍රශ්නයට අදාළ වන පරිදි බයිබලීය පාඨ ගලපන්නට උත්සාහ කරන්න.**

**⋆ ''මා ඔබට ප්‍රේම කළාත් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න ''යන බයි බලීය පාඨයට අනුව පන්ති කාමරය තුළ ප්‍රේමයෙන් එකිනෙකා සමඟ ජීවත්වීම ඔබ පිළිතුරු සමඟ බයිබලිය පාඨයක් නැතිව ලිවීමෙන් එහි කිසිම රසයක් නැත. ඔහ විටෙක ලියන පිළිතුරු මේ ආකාර ගන්නා බව මා දැක ඇත.**

⋆ ළමයින් සමඟ රණ්ඩු නොකරීම
⋆ දන්න් නැති දෙයක් කියා දීම
⋆ ඇති දෙය බෙදාගැනිම

● පිළිතුරු වැරදි නැත. එහෙත් එහි කිසිදු ගැඹුරක් නැත. බයිබලීය හරයක් නැත. එවැනි පිළිතුරු ඔබ නොව ඕනෑම ලබාධිකයකුට ලිවිය හැකිය. එසේ නම් එවැනි පිළිතුරු ලියන්න එපා.

**කෙටි ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියන්නේ / සොයන්නේ කෙසේද?**

**● ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරු තෝරා ගන්නට උත්සහා කරන ප්‍රමාණයට වඩා, වැරදි පිළිතුරු එකිනෙක බවත් කරමින් නිවැරදිම පිළිතුරු තෝරාගන්නට උත්සහ කරන්න.**

**● වැරදි පිළිතුරු ඉවත් කර, නිවැරදි පිළිතුරු කොටු කිරීමෙන් සාර්ථක ලෙස බහුවරණ ප්‍රශ්න පත්‍රයට ලකුණු ලබාගත හැකිය.**

**● පසුගිය ප්‍රශ්න පත්‍රයක් ඇසුරින් මේ ස්වභාවය හඳුනාගනිමු.**
**⋆ 2012 විභාග ප්‍රශ්න පත්‍රය ඇසුරින් මෙය පවසමු.**

2012/19 අපගේ වරප්‍රසාද ජීවිතයේ පූර්ණත්වය අත් දැකිය හැක්කේ
1. ශුද්ධවූ සභාව තුළය
2. සාන්තු වරුන්ගේ සමෝක්ෂ ධර්මලාභය තුළය
3. දේව රාජ්‍ය තුළය 4. කිතුනු පවුල තුළය

**● මෙහිදි පැහැදිලි ලෙස (4) පිළිතුරු වැරදිය. එසේම 2 පිළිතුර ද වැරදිය දැන් ඔබට අවබෝධ නොවන්නේ 1 හෝ 3 යන පිළිතුරු දෙක අතරින් කුමන පිළිතුර නිවැරදිද යන්නයි. එහි ශුද්ධවූ සභාව යන්න දේව රාජ්‍යයට ඉහළින් නැති නිසා අපි නිවැරදි පිළිතුර ලෙස සලකන්නේ පිළිතුරු අංක 3 යි.**

⋆ තවත් ප්‍රශ්ණයක් විමසා බලමු.
**2012 /31 ''මිෂනරී ඔෆ් ද චැරිටි '' නිකාය ආරම්භ කළේ.**

1. යුප්‍රේෂියා මව්තුමිය
2. පීටර් බියෙන්වෙනු නොආයි පියතුමා
3. ලොයෙලාහ ඉග්නේෂස් තුමාය
4. භාග්‍යවත් තෙරේසා මව්තුමිය

**● මෙම පිළිතුරු අතරින් පීටර් බියෙන්මෙනු පියතුමා පිහිටවනු ලැබූ නිකාය වන්නේ ශුද්ධවූ පවුලේ නිකායයි. යුප්‍රේෂියා මව්තුමාය පිහිටවූ නිකාය වන්නේ යහපත් එඬේරාගේ නිකායයි. ලොයෙලා හි ඉග්නේෂයස් තුමා පිටිටෙම්වේ ජේසු නිකායයි. එසේ නම් නිවැරදි පිළිතුර වන්නේ 4යි භාග්‍යවත් තෙරේසා මව්තුමියයි.**

**ඉතිං දුවේ පුතේ, කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයට බයිබලීය පදනමකින් යුතු පිළිතුරු ගලපා ගෞරවනීය A සාමාර්ථයක් ලබා ගන්න ඔබට දේවාශිර්වාදය පතමු.**

## ලෝකයේ විශාලතම ගස් වර්ග

ලෝකයේ විශාලම ගස් ලෙසින් සැළකෙන්නේ ඇමරිකාවේ වැවෙන දේවදාර ගස්වල වර්ග තුනක්. ''රෙජ් වුඩ්'' නමින් හැඳින්වෙන දේවසාර ගස් වර්ගය කැලිෆෝර්නියාවේ විශේෂයෙන් එහි වෙරළබඩ ප්‍රදේශයෙන්හි ඉතා හොඳින් වැවෙනවා. උසම රෙඩ්වුඩ් ගස මීටර්110 ක් උසයි එහි සාමාන්‍ය වටප්‍රමාණය මීටර් 6ක් වෙන බව සඳහන් වෙනවා. ''වෙලින්ටෝනියා නම් අනික් දේවදාර ගස් වර්ගය කැලිෆොනියාවේ කඳුවල දක්නට ගැබෙනවා. ඒ ගසක උස සාමාන්‍යයෙන් මීටර් 90 කට වැඩි වන අතර විෂ්කම්භය මීටර් 9 ක් පමණ වෙනවා. ඩග්ලස් නම් දේවදාර ගස් වර්ගයත් මීටර් 90 කට වඩා උසයි. හිතාගන්න හැකිද ඔබට මේ ගස්වල විශාලත්වය.
**පොත පත ඇසුරෙන්**

**ටෙක්ලා කල්දේරා - දංකොටුව**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 35

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

පසුගිය ලිපිය හා සබැඳේ

### ජැන්සෙනිස්ත වාදය

දෙවැන්න, සාමාන්‍ය කෙනෙකුට තරමක් අශුභවාදී එකක් සේ පෙනී යන්නට ඉඩ ඇති එකකි. එය නම්, මහා පව් බරකින් පෙළීම නිසා විමුක්තිය මිනිසාට පහසුවෙන් දිනා ගත නොහැක්කක් සේ සැලකීම ය. විමුක්තිය අත්පත් කර ගත හැක්කේ ස්වල්ප දෙනෙකුට පමණි. එයද, වධ වේදනා මැද දුක්බර ලෙස ගෙන යනු ලබන ක්‍රියාවලියකින් ය. මිනිසා සුරලොව අත්පත් කර ගැනීමට නම් ප්‍රීති ප්‍රමෝදය හා විනෝදය ගෙන දෙන දේවල්වලින් විශේෂ ඕනෑ කමකින් ඈත්වී සිටිය යුතු ය. කය මර්දනය කරන ක්‍රියාවලට භක්ති අභ්‍යාසවලටත් වඩා මුල් තැනක් දිය යුතු ය.



විසෙන්ති පෝල්

ජැන්සෙනිස්ත වාදයට මුල් වූයේ මේ දෙවෙනි අදහස ය. විසෙන්ති පෝල් තුමාගේ උණුසුම් දයා සේවා චින්තනය සමග සසඳන විට මෙතරම් වියලි දළ දඬු චින්තන රටාවක් එකම ප්‍රංශය තුළ බිහි වූයේ කෙසේදැයි සිතන්නටත් අමාරු ය. එය ප්‍රංශ භූමිය තුළ හැදුණු වැඩුණු චින්තනයක් සේ සාමාන්‍යයෙන් ගනු ලැබුවද එහි ආරම්භකයා වූයේ කෝර්නේලියස් ජැන්සන් නැමැති ඕලන්ද ජාතික රාජගුරු ප්‍රසාදිවරයා ය. ''ජැන්සෙනිස්ත වාදය'' යන වචන සෑදී ඇත්තේ ද ඔහුගේ නම ආශ්‍රයෙනි. ඔහුගේ අදහස අනුව ලෝකය පවින් පිරුණු තැනකි. මිනිසාගේ බොහෝ ක්‍රියා දෙවිඳුන්ට අප්‍රසන්න ය. විමුක්තියට අවශ්‍ය දේව අනුග්‍රහය ලැබෙන්නේ අතලොස්සකට ය. ඒ අතලොස්සට අයත් වීමට අපේක්ෂා කරන අය කායික සැප සම්පත්වලින් ඈත්වී දුෂ්කර චර්යා රටාවක් අනුගමනය කළ යුතු ය.

මෙම කැල්වින්වාදී රෙපරමාදු අදහස (පසුව විස්තර වන පරිදි) එංගලන්තයේ එංගලන්ත සභාව තුළටද ඇතුළු වන්නේ ය. එංගලන්ත සභාව තුළ ඇති වන විපර්යාසය ''පියුරිටානුවාදය'' සේ හැඳින්වෙන්නේ ය. මේ දෙක අතර සමානකම දැක්වීමට ප්‍රංශයේ ජැන්සෙනිස්ත වාදය ඇතැම්හු ''කතෝලික පියුරිටානු වාදය'' සේද හඳුන්වති. ජැන්සෙනිස්තවරුන්ගේ මධ්‍යස්ථානය බවට පත්වී තිබුණේ පැරිසියේ ''පෝට් රෝයල්'' යන ස්ථානයේ පිහිටා තිබුණු කන්‍යාරාමය ය. ප්‍රංශයේ කුල පවුල් වලින් පැමිණි කාන්තාවන් ගෙන් වැඩිදෙනා පැවිදි වී සිටියේ එහි ය. ජැන්සෙනිස්ත වාදය එවැන් කන්‍යාරාමයකට සම්බන්ධ වී තිබීමේ හේතුවෙන් එය රට පුරා පහසුවෙන් පැතිරෙන්නට විය. එම කන්‍යාරාමයේ එක තාපසිකාවක සොයුරෙකු වූ ඇන්ටුවන් ආර්නෝල්ඩ් නිතර සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ පිළිවෙතට එරෙහිව පොතක් පළ කෙළේ ය. ආර්නෝල්ඩ්ගේ එම අදහස ජෙසුයිට්වරුන් විසින් එකල පතුරුවා හරිමින් තිබුණු අදහසට හාත්පසින්ම වෙනස් එකක් විය. දිව්‍ය පූජාවට හවුල් වන හැම විටකම, එහි අවසාන කොටස වන භෝජනයටද හවුල් වීමට ජෙසුයිට්වරු බැතිමතුන් උනන්දු කළහ. ආර්නෝල්ඩ්ගේ මතය අනුව, දිව්‍ය සත්ප්‍රසාදය අතිශයින් පරිශුද්ධවූ දෙයක් වන නිසාත් මිනිසා අතීශයින් අපවිත්‍රවූවකු වන නිසාත්, එය ලැබිය යුත්තේ සෑහෙන සූදන මකට පසුව ය. එම නිසා ඉතාමත් කලාතුරකින් ය. ආර්නෝල්ඩ් ගේ මෙම පොත රට පුරා පැතීරී යන විට විසෙන්ති පෝල් තුමා වයස්ගත වූවෙකුව සිටියේ ය. එතුමන් ඒ මතයට කිසිසේත් ගරු කෙළේ නැත. ''දේව ප්‍රසාද නිධානවලට ගරු කිරීමට සලස්වා මෙම පොත බැතිමතුන් සිය දෙනෙකුට සෙතක් කළා නම්, දේව ප්‍රසාද නිධානවලින් ඈත් කරවා දසදහස් සංඛ්‍යාවකට විශාල හානියක් කෙළේයැ යි. එතුමන් පැවසූවේ ය.

මෙම ''පෝට් රෝයල් '' චින්තන කවයේ සුප්‍රසිද්ධතම නියෝජිතයා වූයේ බ්ලේස් පාස්කල් නැමැත්තාය. ඔහු ප්‍රංශයේ අග්‍ර ගණයේ ගණිත විද්‍යාඥයකු විය. මොහුගේ සොයුරියක්ද එම කන්‍යාරාමයේ විසුවා ය. මොහු මුලදී ආගම ගැන එතරම් උනන්දුවක් නොදැක්වූ කෙනෙකි. ඔහු සම්ප්‍රදායානුකූල භක්ති අභ්‍යාසවල යෙදුනේද එතරම් උනන්දුවක් නැතිව ය. එහෙත් වරක් එනම් 1654 නොවැම්බර් 23 වෙනි දින යාච්ඤා අභ්‍යාසයක යෙදී සිටි අතරතුරේ ඔහුගේ සිත එක විටම වෙනස් විය. එතැන් සිට ඔහු තුළ දැඩි ආගමික භක්තියක් ඇති විය. එදා සිට මරණ මොහොත දක්වා ම ඔහු ආගම ගැන ලියන්නට පටන් ගත්තේ ය. ජැන්සෙනිස්ත වාදියකු වුවද ඔහුගේ ලිපි ලේඛනවල දක්නට ලැබෙන්නේ ජැන්සෙනිස්ත වාදයේ අශුභවාදී පැත්ත නොවේ. එහි වඩා සහනදායක පැත්ත පමණි. ඔහුගේ ලිය කියවිලි ක්‍රිස්තියානි සාහිත්‍යයට අයත් කෘති සේ සැලකීමට තරම් වැදගත් ය.

ඉදිරියට .......

සංස්කාරක පියතුමන් විසිනි

# ජේසු පිහිටයි

**එවක මට වයස නමයක් හෝ දහයක් වන්නට ඇත. නොඉවසිලිවන්තව කියවීමට පුරුදුව සිටි මම අතට අසු වූ ඕනෑම දෙයක් කියවූවෙමි. ඒ අතර ''මහල්ලා සහ මුහුද'' පොත මෙන් ම ''නපුරු යෝධයා'' සිටි චිත්‍රකතා පත්තර ද තිබුණා මතකයි. චිත්‍ර කතාවේ වීරයා වන කඩවසම් කුමාරයා විසින් ''නපුරු යෝධයා'' ගේ මාලිගාවෙහි සිරව සිටි රුවැති කුමරිය බේරා ගනිද්දී සිතට දැනුණු සතුට මෙන් ම වූ සතුටක් නොවුණ ද ''මහල්ලා සහ මුහුද'' නවකතාව අවසානයේදී ද නිරාමිස ප්‍රීතියට ආසන්න ප්‍රීතියක් ලැබුවා මතකය.**



**බෞද්ධ සැදැහැවතියක් දිණමිණ පත්‍රයේ බද්දර මල්ල අතිරේකයට යොමු කළ විශේෂ ලිපියකින් සකස් කෙරිණි.**

''ටොමි මාමාගේ කුටිය'' මේ පොත් අතර මගේ ළපටි සිත කෝවක දමා උණු කරන්නට සමත් වු පොතකි. ක්‍රිස්තියානි ආගමික කාපිරි වහලකු වූ ''ටොමි'' නැමති සේවකයා මුදලට වහල් වෙළෙඳ සල්වල විකිණෙන අයුරුත් එහෙත් ඔහු තම ස්වාමිවරුන්ට ඉමහත් බැති සිතින් ප්‍රේම කරන අයුරුත් මේ කතන්දරයෙහි සඳහන් ය. ක්‍රිස්තියානි ආගමේ ඉගැන්වෙන ''සතුරාට ප්‍රේම කිරීමේ න්‍යාය'' මා විසින් මුලින්ම අවබෝධ කර ගනු ලැබුවේ ටොමි මාමා තමන්ට පණ මෙන් ආදරය කළ කුඩා දැරියක වූ ඊවා නැමති සිය ස්වාමි දුවට ප්‍රේම කළ ආකාරයෙන්ම තමන්ට කස පහර දුන් ''සයිමන්'' නැමති කෲර හිතැති පාලකයාට ද ප්‍රේම කරනු දැකීමෙනි.

මගේ බෞද්ධාගමික ළපටි හිත ක්‍රිස්තියානි ආගමේ මෘදු ඉගැන්වීම්වලින් පිරිමැදීමේ අවසාන ප්‍රතිඵලය වූයේ මා ළපටි සිතකින් දැඩි තීරණයක් ගැනීම ය. එදින අම්මා රැකියාව නිමවී නිවසට පැමිණෙනා තෙක් සිටි මම, ''අම්මේ මට ක්‍රිස්තියානි ආගමට යන්න ඕනෑ'' යයි කීවෙමි.''ඒ මොකද ඒ?'' මගේ කියමන් බොහොමයක් මා ක්‍රියාවට නොනගන බව ද, අනික තනිවම ආගම වෙනස් කිරීමට නම් තවත් අවුරුදු අටක් එනම් වයස දහ අටක් පිරෙන තෙක් සිටිය යුතු බව හොඳින් ම දත් අම්මා වෙනසක් නොපෙන්වා ඇසුවා ය.

අම්මා ගෙනත් දීපු ''ටොමි මාමාගේ කුටිය'' පොත කියෙව්වාට පස්සේ මට එහෙම හිතුණා'' මම කීවෙමි. අම්මා වෙනත් කතා වකට මාගේ සිත යොමු කළ අතර ඉන් අනතුරුව මා වැඩුණු ගැහැනු ළමයෙකු වන තෙක් ම ''ටොමි මාමාගේ කුටිය'' පොත මට දකින්නට ලැබුණේ නැත. ''අම්මේ ඒ පොත නැති වෙලානේ'' යයි මා පැවසූ සැම වාරයකම ''ඔය කොහේ හරි ඇති පුතේ'' යයි කියන්නට අම්මා පුරුදු වී සිටියා ය.

අද මම බෞද්ධාගමික ඉගැන්වීම්වල නියම හරය සහ යථාර්ථවාදී ස්වභාවය දකිමි. බුදුරජාණන් වහන්සේ යනු ශ්‍රේෂ්ඨ දර්ශනිකයකු බව ද වසර දෙදහස් පන්සියයකට පෙරදී සිදු කළ දේශනාවන් සමහරක කරුණු අදටත් විද්‍යාත්මකව තහවුරු නොවුණ ද සැබෑ ලෙසම ලොව පවතිනා බව විශ්වාස කරමි. එසේ වුව ද ක්‍රිස්තියානි ආගමට මා තුළ ඇති ලැදියාව තවමත් හිත ඇතුළතින් හිඳ සමහර දිනක හීනියට හිත කොනිති ගසයි.

මම එය නොදැනුනා සේ හිඳිමි. නමුත් දෙසැම්බර් මාසය ආසන්න වනවිට නත්තලට පල්ලි යන්න දින ගනිමි. සමහර අවුරුද්දක නත්තල් ගසක් සරසමි නත්තල අහවර වන තෙක් නත්තල් ගසේ හැඩ බලමි.

මේ සියලු ආශාවනට සහ ළැදියාවනට එපිටෙන් ක්‍රිස්තියානි ආගම පිළිබඳව සිතිවිලි අවදි කරවන සිදුවීම් පෙළක් පසුගිය කාලය පුරාවට සිදුවීම හේතුවෙන් ඒ ගැන ලියන්නට සිතුවෙමි. අප නිවසට මෑතක සිට උදව්වට පැමිණෙන වයසක කාන්තාවකි. මෙකල කිසි අයකු ඉන්තේරුවෙන්ම විශ්වාස නොකර න නිසාදෝ මසිතෙහි ඇය පිළිබඳව වූයේ ද සැකයකි. ඇය ආගමින් කතෝලිකය. දිනෙන් දින ගතවෙද්දි ඇය විශ්වාස කළ හැකි බව මම ටිකෙන් ටික අවබෝධ කර ගතිමි.

දිනක ඈ මට කතාවක් කීවා ය. ''මැඩම් දන්නවාද අපේ ආගමේ කියනවා එක ගමකට වැහි කුණාටු කාලයක් ලැබුවලු ඉතින් මේ වැස්ස නවතින්නේ ම නැතිලු පස්සේ දෙවියන් වහන්සේට මිනිසුන් යාතිකා කරන්නට පටන් ගත්තලු.....''

''ඉතින්?'' මම හූමිටි තබමි.

''මැඩම් දන්නවාද හේතුව? මේ ගමේ හොරකම් කරන මිනිස්සු බොහොමයිලු. ඒ හොරකම්වලට දඬුවමක් විදිහටලු කුණාටු ඇති වෙලා තියෙන්නේ. ඉතින් ඒ මිනිස්සු හොරකම් කරන එක නැවැත්තුවාම කුණාටුවත් නැවතුනාලු.

ඇය අහිංසක ලෙස සිනාසෙයි මට ඇගේ අවංක බව ඒ දෙනෙත තුළින් දිස්වෙයි මම ද ඇය හා සිනාසෙමි. ඒ අතරතුර මට තවත් ක්‍රිස්තියානි මිනිසකු මුණ ගැසෙයි. ඔහු ප්‍රසිද්ධ ඇඟලුම් ආයතනයක සාමාන්‍යාධිකාරීවරයෙකි. සිය සේවකයකුගේ සොර කමක් පිළිබඳව දැනගත් ඔහු සේවකයා තමන් ළඟට ගෙන්වා අවවාද කරයි. කිසිවිටකත් සිය සේවකයන්ට දැඩි දඬුවම් නොදෙයි. මගේ මිතුරකු නිසා ඔහුගේ නිද්‍රාශීලී කළමනාකාරිත්වය ගැන විමසන්නට මට හැකි විණි. ''දසුනි අපි කවදහරි දවසක දෙවියන් වහන්සේ ළඟට ගියාම අපිට වැරදි කළ අයට අපි සමාව දීලා තියෙනවා නම් විතරයි දෙවියන් වහන්සේගෙන් අප කළ වැරදි වලට සමාව ලැබෙන්නේ. ඔහු ඉහළ අධ්‍යාපනයක් ඇති මිනිසෙකි. ජීවිතය අවබෝධ කර ගත හැකි අයෙකි. නමුත් ඒ ක්‍රිස්තියානි ආගම විසින් ඔහුගේ සිතුවිලි රටාව යහපත්ව වෙනස් කොට ඇති අයුරුය. අත් උදව්වට නිවසට පැමිණෙන කත වැඩ නිමවා නික්ම යයි.

''සිය පවුලටම සමාදනය වේවා! ජේසු පිහිටයි '' ඇය මුහුණෙහි පිරී ඉතිරී ගිය සිනහවෙන් යුක්තව කියයි.

''ජේසු පිහිටයි '' යනුවෙන් මම ද පිළිවදන් දෙමි.

**දසුනි හෙට්ටිආරච්චි**




### අම්මා

හොඳ දේ මට කියා දීලා
මගේ නුවණ පහදාලා
ලෝකය ගැන උගන්වාලා
මා රැකගත් මගෙ අම්මා

**පියුමි හර්ෂණි**
**7 ශ්‍රේණිය**
**දංකොටුව බාලිකා මහා විද්‍යාලය**



### මව් ගුණ සුවඳ

අම්මා නැමැති නිම් නැති ඒ සෙනෙහෙ විල
කිසිම දිනක නිම වන්නේ නම් නොමැත
ඇගේ තිබෙන නොබිඳෙන ඒ දිරියෙන්ම
පිළිබිඹු වෙයි සැනෙකින් මව් ගුණ සුවඳ

**සෙව්මිණි ජයසූරිය**
**9 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**

### දෙවිඳුනේ

දුක වේදනාව හිමි ජීවිතේ
ඒ සියල්ල හැරදැමූ දෙවිඳුනේ
දිරිය සවිය හදමඬලට දුන්නේ
ඔබමයි ඒ සමිඳේ

ඔබ හට ගයනෙමි ඔබ ගුණ පසසමි
එයමයි මා පැතුවේ මේ දිවියේ
එයමයි සැනසීමද ගෙන දෙනුයේ
බලය දෙනු මැනවි සමිඳාණනේ

**නිශාදි කල්පනා ද සිල්වා**
**13 ශ්‍රේණිය**
**ශ්‍රී දිව්‍ය හෘදයේ දහම් පාසල - බලපිටිය**

. . . . . . . . . . . . . . . . . . . . . . . . . .

### ගුරු මව්නි පියෙනි

ජීවිතයේ එක් දෙයක් පමණක් නොව
බොහෝ දේ අප වෙනුවෙන්
කැප කරන ගුරු මව්නි, පියෙනි
විටෙක සහෝදරයකු
විටෙක මිතුරෙකු
තවත් මොහොතක මවක පියක වූවා අප හට
ඇල්වෙන මිණි පහනකි අපට ඔබ සැම

**දෙව්මි නිලුක්ෂි**
**11 ශ්‍රේණිය**
**ලොයොලා විදුහල - බෝපිටිය**

## මාසික සිතිවිල්ල - නොවැම්බර් මාසය
## ජයග්‍රාහී නිර්මාණයන්

කරුණාබරිත වූ පියාණෙනි
ජීවත්ව සිටියදී සතුටිනි
අප සැම රක්ෂා කරමිනි
ගිය දා එදා අප හඬවා
හදවත පැලී රූ රා ගියා
කඳුළු බිඳු වගුරුවා
කෙසේ කියම්ද දුක අපේ

**නිමේෂා මුතුහාරී**
**8 ශ්‍රේණිය**
**නිව්ස්ටෙඩ් බාලිකා**
**විද්‍යාලය - මීගමුව**

ජීවය ඇත පිපී විකසිත
මල් ලෙසට
දුක සහ සතුට උතුරයි එහි
රොන් ලෙසට
දෙවිඳුන් මවා ඇත අප විස්මිත
ලෙසට
මල මෙන් පරවෙයි ජීවය
මේ ලෙසට

**හිරුණි රංසිකා**
**9 ශ්‍රේණිය**
**ශා. ඉසිදෝරු දහම් පාසල**
**තිබ්බොටුගොඩ**



**සේයා**
**ටෝනි නිශාන්ත ප්‍රනාන්දු**

**මාසික සිතිවිල්ල**

"දෙසැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 120

## අපි ඉංග්‍රීසි භාෂාවේ වැදගත්ම වචනයක් වන **have** පිළිබඳ ඉගෙන ගනිමු

3. ඊළඟට **have / has** යෙදෙන තවත් අවස්ථාවක් තමයි සහකාර පදයක් ලෙස ක්‍රියාකරන අවස්ථාව.

අපි Perfect Tense ගැන කලින් ඉගෙන ගත්තා. perfect tense වලදී Past Participle එක සමග **has / have** යෙදෙන බව ඔබ දැන් දන්නවා.

**නිදසුන්:**

I have seen that film. (අයි හැව් සීන් දැට් ෆිල්ම්)
මම ඒ චිත්‍රපටිය දැකල තියෙනවා.

They have gone to church (දේ හැව් ගෝන් ටු චර්ච්)
ඔවුන් පල්ලි ගිහිල්ලා

Somebody has torn my book(සම්බොඩි හැස් ටෝ(ර්)න් මයි බුක්)
කව්රුහරි මගෙ පොත ඉරල.

4. ඊළඟට **have/has** යෙදෙන තවත් අවස්ථාවක් තමයි යමක් භුක්ති විඳිනවා, රස විඳිනවා, යමක නිරත වෙනවා වගේ අදහසක් ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

**නිදසුන් :** Would you like to have a tea?
(වුඩ් යූ ලයික් ටු හැව් අ ටී?) ඔබ තේ එකක් බොන්න කැමති ද?

No, I will have a coffee (නෝ, අයි විල් හැව් අ කොෆි)
නෑ. මං කෝපි එකක් බොන්නම්.

මෙහිදී have කියන වචනෙන් අදහස් වෙන්නේ drink (බොනවා) කියන අදහසයි.

He went out of the hall. I think he wants to have a smoke.
(හී වෙන්ට් අවුට් ඔෆ් ද හෝල්. අයි තින්ක් හී වෝන්ට්ස් ටු හැව් අ ස්මෝක්)
ඔහු ශාලාවෙන් පිටතට ගියා. මං හිතන්නෙ ඔහුට දුම් වැටියක් බොන්න අවශ්‍ය වෙලා වගේ.

මෙහිදීත් have a smoke (නැත්නම් have a cigarrette) කියන එකෙන් අදහස් වෙන්නෙ දුම්වැටියක් බොනවා කියන අදහස. (මෙහිදී have කියන්නෙ = 'smoke' කියන අදහස)

What time do you have lunch? (වට් ටයිම් ඩූ යූ හැව් ලන්ච්?)
කීයට ද ඔබ දිවා ආහාරය ගන්නෙ?

Usually I have my lunch around one o' clock.
But today I'm having a late lunch.
(යුෂුවලි අයි හැව් මයි ලන්ච් අරවුන්ඩ් වන් ඔ ක්ලොක්.
බට් ටුඩේ අයැම් හැවිං අ ලේට් ලන්ච්)
මම සාමාන්‍යයෙන් දිවා ආහාරය ගන්නෙ එකහමාරට විතර.
නමුත් අද මම දවල් ආහාර ගන්නෙ ටිකක් පමා වෙලා.
(මෙහිදී 'have' කියන එකෙන් අදහස් වෙන්නෙ 'eat' කියන එක)

They have gone to N'Eliya. They are having a nice time.
(දේ හැව් ගෝන් ටු නුවර එළිය. දේ ආ(ර්) හැවිං අ නයිස් ටයිම්)
ඒ ගොල්ලො නුවරඑළි ගිහිල්ලා ඒගොල්ලො හොඳට විනෝද වෙනවා.

(මෙහිදී having a nice time කියන්නෙ ඒ ගොල්ලො බොහොම සතුටින් ඒ ගමන වින්දනය කරනවා, ආස්වාදයක් ලබනවා. කියන අදහසයි. මෙහිදී have වලින් පිළිබිඹු වෙන්නෙ 'enjoy' කියන අදහසයි.

දැන් ඔබට පැහැදිලි ඇති නේද? මේ වගේ වැකි වලදී have හෝ has යන වචන වලින් ප්‍රකාශ වෙන්නෙ eat, drink, enjoy වගේ අදහස් බව අවබෝධ කරගන්න.

5. අපිට **have/has** යෙදෙන තවත් අවස්ථාවක් වෙන් කොට හඳුනාගත හැකියි. යමක් සිදුවෙනවා, යමකට මූණපානවා, යම් සිදුවීමකට යටත් වෙනවා, වැනි අදහස් ප්‍රකාශ කිරීමේදීත් සමහර විට **have / has** යෙදෙනවා.

She had a baby. had කියන්නෙ has/have වල අතීත පදය බව ඔබ දන්නවනෙ) (ෂී හැඩ් අ බේබි) මින් අදහස් කරන්නේ ඇයට දරුවකු ලැබුණා. දරුවකු ප්‍රසූත කළා කියන අදහස.

She had a car කිව්වනං ඒකෙන් අදහස් වෙන්නෙ ඇයට කාරෙකක් තිබුණා. (දැන් නැහැ) කියන එකයි. ඒක අපි ඉහත සඳහන් කළ "අයිතිවාසිකම" ගැන කීම සඳහා have / has / had යොදන අවස්ථාවක්.

නමුත් මෙහිදී She had a baby කිව්වනම් ඒකෙන් අදහස් වෙන්නෙ ඇයට දරුවෙක් හිටියා දැන් නැහැ කියන එක නෙවේ. ඒක තේරුමක් නැති අදහසක්.



දෙහියාගාත මීසමට අයත් දූ දරුවන් 340 ට අභිවෘද්ධි ආලේපනය දේව ප්‍රසාද නිධානය දනය කිරීම, කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්, ගරු පිලි මුතුකුඩආරච්චි පියතුමන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි. මීසම් සහයක ගරු ටෙරන්ස් ප්‍රසංග පියතුමාගේ මගපෙන්වීම යටතේ දහම් ගුරුවරුන්ගේ සහයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරීනි. **මනීෂ මධුසංඛ**

# මීරිගම මීසමේ දහම් ළමෝ ලේඛන කලාව ගැන ඇනුම්වත් කෙරෙති.

කොළඹ අගරදගුරු පදවියේ මායිමක් වන මීරිගම මීසමේ දෙව් මැඳුරුවලට අයත් දහම් පාසල් හි ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගිය ද මීරිගම ශු. ජපමාල මාතා දෙව් මැදුරේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මීරිගම මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරීනි. මීට එක්වු ළමුන් හා දේශක මහතා හඳුන්වාදෙන ගරු පියතුමන් සේයාරුවෙහි දිස්වේ.

**සටහන - නිමල්කා තිලකසිරි / සේයා - අමල් ඉන්දික**



# දහම් ළමුන්ගේ කුසලතා එළිදැක්මක්.....



කෝට්ටපිටිය මීසමට අයත් කුරුකුපනේ දහම් ළමුන්ගේ කුසගතාවයන් එළිදැක්වීම අරමුණු කරගෙන සංවිධානය කරනු ලැබු ''දිලෙන තරු'' විවිධ ප්‍රසංගය පසුගියද කෝට්ටපිටිය දහම් ශාලාවේදී පැවැත්වුණි. හලාවත පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් රංගන ශිල්පිනි කාංචනා මෙන්ඩිස් මහත්මිය, ගායන ශිල්පි චන්දන ලියනආරච්චි මහතාගේ සහභාගීත්වයෙන් මෙය පැවැත්වුණි. මීසම් සහයක ගරු ප්‍රශාන් ගෝමස් පියතුමන්ගේ සංකල්පයක් අනුව මෙය සංවිධානය කෙරීනි.

**සුරේකා**



**දිය ඇල්ලක්**

තමාරා සෙව්වන්දි

06 ශ්‍රේණිය

සාන්ත බෙනඩික් දහම් පාසල

කන්ජුක්කුලිය

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**අපේ නිවස**

අවිශ්කා ඉවංජි ප්‍රනාන්දු

07 ශ්‍රේණිය

සිරිහඳ දහම් පාසල

රාජගිරිය

**ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබීම**

නිමේස් සශ්න පෙරේරා

03 ශ්‍රේණිය

සා. අන්තෝනි විදුහල - මහනුවර



**දර කඩන ළමුන්**

නිවේදා මේරියන් ප්‍රැන්සිස්

09 ශ්‍රේණිය

ශා. මරියා දහම් පාසල

කෑගල්ල





**දෙවිඳුන් මැවූ මනරම් ලෝකය**

උෂානි මධුෂිකා

07 ශ්‍රේණිය

ශා. කයිතානු දහම් පාසල - කොටුගොඩ



**චීත්ත මෝස්තරයක්**

පවනි කෞශල්‍යා

05 ශ්‍රේණිය

ශා. මරියා දහම් පාසල වැල්ලවාය

# ශු. ඉරනේයස් මුනිතුමා




ක්‍රි.ව. 130-140 පමණ කාලයේ දී සුළු ආසියාවේ ස්මිර්ණා නුවර උපත ලද බවට සැලකිය හැකිය. මව්පියන් ගැන හෝ කුඩා කාලයේ ආගමික ජීවිතය ගැන හෝ එතරම් යමක් කිව නොහැක. කෙසේ වෙතත් කුඩා අවධියේ සිට පොලිකාප් තුමාගේ ඇසුර ලැබූ බවට නම් සාක්ෂි ඇත. එව්සේබියස් තුමාට අනුව ඉරනේයස් තුමා විසින් ෆ්ලොරීනස් තුමාට ලියන ලද ලිපියෙහී සඳහනකට අනුව ඉරනේයස් තුමා පොලිකාප් තුමාගේ දේශනාවලට සවන්දී ඇත.




ක්‍රි.ව. 170 දී ප්‍රංශයට පදිංචිය සඳහා ගිය මෙතුමා පසුකලක ලියෝන්ස් නුවර රදගුරු තනතුරට පත්වූ බව ඉතිහාසයේ දැක්වේ. මෙතුමාගේ පොත්වලින් අදට ඉතිරිව ඇත්තේ පොත් දෙකක් පමණයි. එකක් නොස-ටික් වාදයට විරුද්ධව ලියූ පොතකි. අනික අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ ලියන ලද ග්‍රන්ථයකි. නොස්ටික් වාදයට විරු-ද්ධව ලියන ලද ග්‍රන්ථයේ කාණ්ඩ පහකි. ග්‍රීක භාෂාවෙන් මෙහි මුල් පිටපත ලියා ඇත. නමුත් ඒවා විනාශවී ඇති බැවින් අඩංගු කරුණු ගැන යමක් කිව නොහැක. ලතින් පරිවර්තනයකින් කළ කාණ්ඩයක් හා අර්මේනියානු පරිවර්තනයකින් කළ කාණ්ඩයක්ද ඉතිරිව ඇත. මේනිසා මෙම ග්‍රන්ථයේ අඩංගු කරුණු බොහෝමයක් දැනගත හැකිවී ඇත්තේ ලතින් පරිවර්තනයෙනි.

ඔහු විසින් ලියනලද ප්‍රධාන කෘතිය වන මෙම ග්‍රන්ථය ලියා ඇත්තේ නොස්ටික් වාදී මත ඉදිරිපත් කළ වැලන්ටීනස් (**Valentinus**) හා මොන්ටේනස් (**Montenus**) යන අයගේ මිත්‍යා මත ප්‍රතික්ෂේප කිරීම සඳහාය. මෙහි පළමු කොටස ඥානවාදීන්ගේ ඉගන්වීම් වල අසත්‍යභාවය ගැන කතාකරයි. දෙවන කොටස දර්ශනවාදය පදනම් කරගෙන මෙම දුර්මත ගැන කරුණු ඉදිරිපත් කරන අතර ඒවා සභාවේ ධර්මයට පටහැනි වන්නේ කෙසේද යන්න ගැන විස්තර කරයි. අනෙක් කොටස් තුන සභා සම්ප්‍රදායන් හා ශුද්ධවූ ලියවිල්ල පදනම් කරගෙන සභාවේ නියම ධර්මය ගැන කතා කරයි. අවසන් වශයෙන් ඥානවාදීන්ගේ ඉගන්වීම් ප්‍රතික්ෂේප කරමින් තර්කානුකූලව ඒවා බිඳ දැමීමට ඉරනේයස් තුමා උත්සහ දරා ඇත. මෙලෙස අවසන් කොටස් තුන තුළ කතෝලික විශ්වාසයේ පදනම (**Rule of the Catholic Faith**) ගැන කතා කරයි. අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් යන කෘතිය (**The Presentation of the Apostolic Teaching**) ඔහුගේ දෙවන කෘතියයි. ඔහු මෙහිදී බයිබලය පදනම් කරගෙන දෙවියන් වහන්සේ තමන් වහන්සේවම දීර්ඝ කාලයක් ඔස්සේ මිනිසාට එළිදරව් කරමින් මිනිසා සමඟ කිට්ටු සම්බන්ධයක් පවත්වා ගෙන ගොස් අන්තිමේදී ක්‍රිස්තුස් වහන්සේ තුළ උන්වහන්සේගේ නියම ක්‍රියාකාරිත්වය හා නියම ස්වභාවය අනාවරණය කළ ආකාරය බයිබලය ආශ්‍රයෙන්ම පෙන්වා දෙයි. ඔහු ජොහාන් සුබ වදනේ සඳහන් පෙරවදන අනුව ක්‍රිස්තුන් වහන්සේ ලෝගොස් (**Logos**) හෙවත් දෙවියන් වහන්සේගේ වචනය බවත් උන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රේමය බවත් ක්‍රිස්තුන් වහන්සේ දෙවන ආදම් බවත් ප්‍රකාශ කළේය. එමෙන්ම මාංශවත් ක්‍රිස්තුන් වහන්සේ පූර්ණ මිනිසෙක් බව කියමින් සුභාරංචි සතරේ ඇති උත්තරීතර බවට මුල් තැන දියයුතු බව තරයේ කියාපායි. සත්‍ය පැහැදිලි කිරීමේදී නිතරම අපෝස්තුළු වරුන්ගේ ඉගැන්වීම් අනුව එය සිදුවිය යුතු බව කියන ඉරනේයස් තුමා ක්‍රිස්තු සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බවද පවසයි. එබැවින් එම ශරීරයේ පැවැත්ම ශුද්ධවූ ලියවිලි අනුව වියයුතු බවද ඉරනේයස් තුමා පැවසුවේය. ඉරනේයස්ගේ දේව ධර්මයේ මූලික තැනක් ක්‍රිස්තුන් වහන්සේට හිමිවේ. මැවිල්ලේ මූලිකයා හෙවත් ප්‍රථම මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේ බව කියන මෙතුමා මිනිසාගේ විමුක්තිය සඳහා උන්වහන්සේ මිනිසත් බව ගෙන ලොව පහළවූ බවත් මේනිසා ක්‍රිස්තුන් වහන්සේ නව මිනිසා හා නව ආදම් බවත් පවසයි. ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යය මගින් ඇතිවූ සාතන්ගේ පරාජය මානව විමුක්ති ඉතිහාසය තුළ සිදුවූ සාතන්ගේ ප්‍රධානම පරාජය බව එතුමා පෙන්වාදෙයි. නමුත් මේ පරාජයෙන් අත්වූ ජය නැතහොත් ගැලවීම යමෙකුට හිමිකරගත හැක්කේ ක්‍රිස්තුන් වහන්සේ විසින් පිහිටුවන ලද උන්වහන්සේගේම ශරීරය වන ක්‍රිස්තියානි සභාව තුළින් පමණක් බවද ඔහු පවසයි. දේව ධර්මය තුළ ක්‍රිස්තු භක්තිකයා රැඳී සිටිය යුතුය යන මතය ඉරනේයස් තරයේ විශ්වාස කළේය. ඒ සඳහා අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම මත කිතුනුවා රැඳී සිටිය යුතු බව ඔහු අවධාරණය කළේය. කිතුනු ජීවිතයේ මූලික අරමුණ දෙවියන්ට සම්බන්ධවීම නැතහොත් දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයක් (**Image of God / imago Dei**) බවට පත්වීම යැයි ඔහු ප්‍රකාශ කළේය.

පූපකැඩීමේදී හෙවත් ශුද්ධ සහභාගිකමේදී යොදාග න්නා පූපවල ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩවසනබව ඔහු කියා සිටියේය. ඔහුගේ දේවධර්මය තුළ කැපී පෙනෙන සාධකයක් නම් එතුමා නිතරම ශුද්ධ ලියවිලි පාඨ ඇසුරෙන් වාග් මාලාව හැසුරවූ බවයි. ඔහු ක්‍රිස්තු කේන්ද්‍රීය දර්ශනයකින් පුරාණ ගිවිසුම දෙස බලන අතර මැවිල්ලට පෙරත් ක්‍රිස්තුන් වහන්සේ සිටි බව අනාවරණය කිරීමට උත්සහ දරයි. ඔහුගේ දේව ධර්මය බයිබලය (**Scripture**) හා සභාවේ ඉගැන්වීම් (**Tradition**) මත පදනම් වී ඇත. එබැවින් සභා මාතාව ඔහු ශ්‍රේෂ්ඨ දේව ධර්මාචාර්ය වරයකු ලෙස සලකයි. නොස්ටික් වාදය, ජුදෙව් වාදය හා ග්‍රීක දර්ශන වාදය යන විවිධ මත වාදවලින් ක්‍රිස්තු ධර්මය ආරක්‍ෂා කර ගැනීමට අයිරේනියස් තුමාගෙන් වූ සේවය අතිමහත්ය. මෙතුමා ක්‍රි.ව. 202 දී වේද සාක්ෂිවරයකු ලෙස දිවි පිදූ බව කියැවේ.

**අසේල දසනායක විසිනි**



## ප්‍රහේළිකා අංක 42

### හරහට

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසූවේ ''බලන්න, මා ස්වාමීන් වහන්සේගේ ......................... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදුවේවා'' යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. .................. නොවරදදා ගැනීමට පරිස්සම් වන්න. නැතිනම් ඔබ ගැන සෝදියෙන් සිටින්නාට ඔබ අසුවන්නට පුළුවන් යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. ''සමිඳුන්'' මහා නරපතීන් සිය සිහසුන් වලින් ...................... හෙලා දිනයන් ඉහල නංවා උසස් කළ සේක.. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සුව කළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේ ට ස්තුති කරන්නට නැවත නොපැමිණි සංඛ්‍යාව.

8. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසුතුමාගේ උපත සිදුවූයේ ගවලෙනකය.

### පහළට

1. මරියතුමියව දේවමාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය ........... රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. ''සමිඳාණන් සාගිනි වූවන් .................. දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමා තම එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය ............. හොඳ හැටි පිරිසිදු කරන පිණිසක්, ධාන්‍ය නෙලා සිය අටුවෙහි රැස් කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතෙහි කුල්ල ඇත. හිස්තැනට සුදුසු වචනය.

5. මරියතුමිය තම කුළුදුල් පුත්‍රයාව බිහිකොට රෙදිවලින් .................... ගව ඔරුවක සැතපුවාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ස්නාවක ජුවාම් තුමා ඉපදෙන විට සකරියස්තුමා ගොළුව සිටි බැවින් තම පුත්‍රයාට දිය යුතු .................. ගල්ලෑල්ලක ලියා පෙන් වූ බව ශු. බයිබලයේ සඳහන් වේ හිස් තැනට සුදුසු වචන

7. ''කිසිවෙකු පහනක් දල්වා බඳුනකින් වසන්නේවත් යහනක් තබන්නේවත් නැත ඇතුළු වන්නන්ට එළිය ගෙනෙන පිණිස පහන් රුක උඩ තබති. '' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලුක් 1,2,3,4, 17,19,8/16 උපදේශකයා හෙවත් සිරාක් 28/13 )

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා –** කිරිමැටියාගාර

## ප්‍රහේළිකා අංක 41 පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 වැ | න් | 2 ද | ඹු | 3 ව | |
| න | | තා | | 4 තා | 5 ය |
| සී | | 6 ත | 7 ලෙ | න් | තු |
| 8 ම | 9 ව | | තා | | ර |
| | තු | | | 10 ග | |
| | 11 ර | ෆා | යෙ | ල් | |

## ප්‍රහේළිකා අංක 41 - ජයග්‍රාහකයෝ

- **1 වන ස්ථානය**

  හිරුණි නිමේෂා - 10 ශ්‍රේණිය

  ශා. ඉග්නාසියුස් දහම් පාසල - අම්පාර

- **2 වන ස්ථානය**

  ලෂිනි දෙව්මිණි - 05 ශ්‍රේණිය

  ශු. ජුසේ මුනිඳු දහම් පාසල - සෙම්බැට්ට

  (කඩයාමට්ට මීසම)

- **3 වන ස්ථානය**

  ඉසුරි කාවින්දි - 04 ශ්‍රේණිය

  ලොයලා විදුහල - බෝපිටිය


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස්
31
හෙබ්‍රෙව් නායකයන් කැඳවූ පාරාවෝ ඔවුනට නව නීති පැනවූහ...
ගඩොල් පිච්චීමට අවශ්‍ය පිදුරු මින්පසු අප විසින් නුඹලාට සපයන්නේ නැත. ඒවා නුඹලාම සපයාගෙන ගඩොල් සැදිය යුතුයි.. එනමුත් සාදන ගඩොල් ගණන අඩු කරන්න බැ.. ඒවා කලින් සැදූ ගාණටම සැදිය යුතුයි..
රජතුමනි.. අපිට පිදුරු සොයාගෙන එන්න බැහැ. අපි කොහොමද එහෙම කරන්නෙ.. ඒක ඉතාම දුෂ්කර වැඩක්.....
ඒවායින් මට වැඩක් නැ.. නුඹලාව ගලවාගෙන යාමට ඒ දෙදෙනාගේ කීම් වලට රැවටිලා.. වැඩ නොකර සිටීයාට මට කරන්නට දෙයක් නැහැ..
....කරපල්ලා....
මෙසේ පාරාවෝ වහල්ලන්ට නව නීති පනවා.. ඔවුන්ව දැඩි පීඩනයකට පත්කළේය..
ආහ්!
හෝයි.. වැඩ කරපල්ලා.. මුං ටික මහා කම්මැලි ජාතියක් වෙලා..
හෙබ්‍රෙව් වහලුන් බොහෝ වැර වෑයමෙන් වැඩ කළද රජුගේ අවශ්‍යතාවය පරිදි ගඩොල් සැපයීමට ඔවුනට නොහැකි විය...
ගඩොල් මදිවෙන්න බැ.. කම්මැලි නොවී වැඩ කරපල්ලා...
අපට පිදුරුත් සපයාගෙන.. ගඩොල් නියමිත ප්‍රමාණය දෙන්න අමාරුයි.... මොකද කරන්නේ...
අපි පාරාවෝට මේ ගැන කියමු...
රජතුමනි, ඔබතුමාගේ නියෝගයට අනුව... අපට පිදුරුත් සපයාගෙනම කලින් දුන් ගඩොල් ගණන දෙන්න අමාරුයි.. අපට කලින් වගේම.. පිදුරු සැපයුවහොත් ගඩොල් නියමිත ගාණ දීමට හැකියි...
ඊශ්‍රායෙල් ජාතිකයිනි.. නුඹලා මහා කම්මැලි ජාතියක් වෙලා.. අර මිනිස්සු දෙන්නගේ කතා අහලා.. රැවටිලා.. දෙවියන්ට පූජා ඔප්පු කරන්න කාන්තාරයට යන්න... උන්ට නැහැ නුඹලාව ගලවා ගන්න. කොහෙද උඹලගෙ දෙවියෝ ඉන්නේ.... ....ආපසු වැඩට පලයව්.. ..කම්මැලියො...
















## ‘මරිය වසර’ සමරණ ‘කඳාන ධර්මදූතයෝ’

කඳාන දිසා ධර්මදූත ළමා සමාජයන් එක්ව ‘මරිය වසර’ තේමා කරගනිමින් පවත්වනු ලැබූ කඳාන දිසා ජපමාල රැළිය පසුගියදා උස්වැටකෙයියාව දේවස්ථානයේදී පැවැත්විනි. දේව මාතා ප්‍රතිමාව පෙරහැරෙන් වඩමවාගෙන පැමිණි ධර්ම දූත ළමා සමාජ සාමාජිකයින් හා සජීවක සජීවිකාවන් දේවමාතාවන්ට ගෞරවය දැක්විය. මේ සඳහා උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමා ප්‍රමුඛ දිසාවේ පියවරුන් රැසක්ද සහභාගී විය.

**සටහන/ ඡායාරූප : තිළිණ අලහකෝන් (හිටපු සජීවක)**

